**ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මු. රෙ. 1645 (අ) | නැත | වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව තබා ඇති බවට වගබලා ගත යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් එම ලොග් පොත් අඩුපාඩු සහිතව පවත්වා තිබුණි. විගණන නියැදි පරීක්ෂාව අනුව අංක PK- 7050, අංක PE - 1685 සහ අංක JV - 1497 දරන වාහන වෙනුවෙන් පවත්වන ලොග් පොත්වල වාහනය පිළිබඳ විස්තර පිටුවෙහි වාහන මූලික විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික ආදායම් බලපත්‍ර පිළිබඳ විස්තර, අයිතිය පැවරීම, හදිසි අනතුරු, රියදුරන් මාරු කිරීම, ගමන් පිළිබඳ මාසික සාරාංශ වැනි තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය | 1,501,080 (අත්තිකාරම් ලැබීම්)<br><br>1,490,567 (අත්තිකාරම් ගෙවීම්) | 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ භාණ්ඩාගාර මුද්‍රිත SA - 52 අනුව සැසඳීමේදී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි අත්තිකාරම් ගිණුම් ලැබීම් සහ ගෙවීම් ලෙස පිළිවෙලින් රු.17,775,377 ක් සහ රු. 12,065,063 ක් වූ අතර, එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 19,276,457 ක් සහ රු. 13,555,630 ක් විය. ඒ අනුව හරස් සටහන් මගින් අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් වටිනාකම් මූල්‍ය කාර්ය සාධන | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හරස් සටහන් ඇතුළත් කිරීම අවශ්‍ය නොවන බැවින් එසේ ඇතුළත් කර නොමැත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයන් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රකාශයෙහි ඇතුළත් නොකිරීම නිසා අත්තිකාරම් ලැබීම් රු. 1,501,080 කින්ද, අත්තිකාරම් ගෙවීම් රු. 1,490,567 කින් ද අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 ඔක්තොබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 4 ඡේදය | 7,700,000 | 2019 මාර්තු 31 දිනට පෙර දෙපාර්තමේන්තුව භාවිතා කළ වාහනවල අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් වන ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, වරින්වර අදාළ අමාත්‍යාංශය වෙනස්වීම සහ කොම්ප්ට්‍රොලර් ජනරාල් විසින් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා දී ඇති වාහනවල අයිතිය කල්බදු අවසන්ව ලංකා බැංකුව විසින් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා දී නොමැතිවීම යන හේතු නිසා රු.7,700,000 ක් වටිනා වාහන 02ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | වාහනවල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගත යුතුය. |

**2.2 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවීම් කර ඇතත් බැංකුවට ඉදිරිපත් නොවූ ලෙස දක්වා ඇති රු.6,380,684 ක් වටිනා චෙක්පත් 113 ක් ගිණුම් අංශයෙන් අදාළ පුද්ගලයින් හෝ ආයතන වෙත භාරදීමට කටයුතු කර තිබුණේ 2023 ජනවාරි 03 සිට පෙබවාරි 28 දක්වා වූ කාලය තුළ දීය. ඒ අනුව ඒවා වැඩ කරන දින 02ත් 24ත් අතර කාලයක් ගිණුම් අංශය තුළ පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආදායකයින්ගේ ඉදිරිපත් වීමේ ප්‍රමාදය හේතුවෙන් චෙක්පත් ගිණුම් අංශයේ රැඳී තිබුණි. | චෙක්පත් ලියූ වහාම අතින් හෝ ලියාපදිංචි තැපෑලෙන් ආදායකයාට භාරදිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ දැක්ම "ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස කළමනාකරණය කිරීම" වන අතර, මෙහෙවර "පාරිසරික සමතුළිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ත ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට සහායවීම" වේ. ඒ වෙනුවෙන් 2007 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනයට 2018 අගෝස්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව එය සංශෝධනය කිරීමට සකස් කළ අවසන් කෙටුම්පත ඉඩම් හා සංවාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කඩිනමින් සිදුකර ගත යුතුය. |

### 3.2 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2022 ජනවාරි 19 දින ගණන්දීමේ නිලධාරි විසින් මාසයක කාල පමාවකින් පසු අනුමත කර ඇතත් ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂ වලදී විධිමත් පරිදි කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (**FAO**) විසින් 2022 පෙබරවාරි 02 දින ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට **GPS** යන්ත්‍ර 03ක් පරිත්‍යාග ලෙස ලබා දී ඇති නමුත්, ඒවායෙහි වටිනාකම තක්සේරු කර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | යන්ත්‍ර වටිනාකම තක්සේරු කර වත්කම් ලෙස ගිණුම් ගත කළ යුතුය. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු. රෙ. 880 **(i)** ප්‍රකාරව රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව හා භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කළ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 වගන්තියෙහි ඇප තැබිය යුතු බව තවදුරටත් අවධාරණය කර තිබියදී, දෙපාර්තමේන්තුව විසින් එසේ ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව සඳහා 2022 පෙබරවාරි 01 දින සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | ගණන් දීමේ නිලධාරියට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීමේ බලතල නොමැති අතර එය පත් කිරීමේ බලධාරියා වෙත දන්වා ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු නොපමාව පත්කළ යුතුය. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක **DMA/**1–2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට එක බැගින් වර්ෂයකට 04 ක් වන පරිදි පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති වුවද රැස්වීම් 02 ක් පවත්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්විය යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 697 ක් වන නමුත්, තථ්‍ය සංඛ්‍යාව 620 ක් විය. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 1 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 36 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 19 ක් සමඟ මුළු පුරප්පාඩු 77 ක් පැවතියද, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම සියයට 75 ත් සියයට 100 ත් දක්වා පරාසයක තිබුණි. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාවන් පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේදී රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ප්‍රතිපාදන අවම ප්‍රමාණයක් ලැබීම මත අඩු කාර්යමණ්ඩලයකින් කාර්යසාධනය සපුරා ඇතත් දෙපාර්තමේන්තුවේ ප්‍රශස්ත කාර්යභාරයක් සඳහා දැනට අනුමත සේවක සංඛ්‍යාවෙහි අවශ්‍යතාවය පවතී. | ආයතනයේ සේවක සංඛ්‍යාවන් පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කර ඒ අනුව කාර්ය මණ්ඩල බඳවා ගත යුතුය. |